# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 43/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 10/01/2024<br>පැය 1130 |

**මාධ්‍ය නිවේදනය**

**විෂ මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.**

විෂ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් හා බෙදා හරින්නන්ගේ ජාලයන් මර්ධනය කර ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2023.12.17 වන දින සිට විශේෂ මෙහෙයුම් ආරම්භ කර ඇත.

එයට සමගාමීව 2024.01.09 වන දිනය තුල සිදු කරන ලද මුළු වැටලීම් 1004 කට අදාලව සැකකරුවන් 977 ක් හා සැකකාරියන් 22 ක් අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් 31 ක් වැඩිදුර විමර්ශන සඳහා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිත ඇති අතර, සැකකරුවන් 26 දෙනෙකු පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

**මෙම මෙහෙයුමේදී බස්නාහිර පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 376 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 162 ක්, ගංජා ග්‍රෑම් 208 ක් පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 526 කදී සැකකරුවන් 514 ක් හා සැකකාරියන් 12 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**දකුණු පළාත ආවරණය වන පරිදි සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් වලදී හෙරොයින් ග්‍රෑම් 19 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 ක් හා ගංජා ග්‍රෑම් 56154 ක් ද පොලිසිය භාරයට ගෙන ඇති අතර එම පළාත තුල සිදු කල මුළු වැටලීම් 96 කදී සැකකරුවන් 93 ක් හා සැකකාරියන් 03 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

වැටලීමට අදාල විශේෂිත සංඛ්‍යා තොරතුරු පහත සඳහන් කර ඇත.

2024.01.09 වන දින සිදු කරන ලද වැටලීම් සම්බන්ධ වාර්තාව.

| | | |
|---|---|---|
| හෙරොයින් | ප්‍රමාණය (g / mg) | 453.29 |
| අයිස් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 306.444 |
| ගංජා | ප්‍රමාණය (g /mg) | 57317.389 |
| | ගංජා පැළ | 31168 |
| වෙනත් මත්ද්‍රව්‍ය | ප්‍රමාණය (g / mg) | 1733.55 |
| මත්පෙති | | 234 |
| මුළු වැටලීම් ගණන | | 1004 |
| අත්අඩංගුවට ගත් මුළු සැකකරුවන් ගණන | ස්ත්‍රී | 22 |
| | පුරුෂ | 977 |
| රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීමට අපේක්ෂිත සැකකරුවන් ගණන | | 31 |
| පුනරුත්ථාපනය සඳහා යොමු කිරීමට අපේක්ෂිත පුද්ගලයින් ගණන | | 26 |

**යුක්තිය මෙහෙයුමට සමගාමීව 2024.01.09 වන දින දිවයින පුරා සිදු කරන ලද බස්රථ පරීක්ෂා කිරීමේ රථවාහන මෙහෙයුම් වාර්තාව.**

පරීක්ෂා කරන ලද බස්රථ සංඛ්‍යාව - 704

පරීක්ෂා කරන ලද වෙනත් වාහන සංඛ්‍යාව - 569

මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව - 08

**අත්අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය ප්‍රමාණය**

හෙරෝයින් මත්ද්‍රව්‍ය - 260

ගංජා - 206g 220 mg

නීති විරෝධී මත්පැන් - 1000ml